පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

විෂය - තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

සතිය- පළමු සතිය

9 ශ්‍රේණිය

සැකසුම- H.N අබේගුණරත්න, කලවාන ජාතික පාසල

- *මේ කාලය තුළ සෑම විෂයක්ම පුණරීක්ෂණයේ යෙදෙමින් අධ්‍යාපන කටයුතු වල නිරතවීම ඔබගේ වගකීමකි.*
- *මෙම කාර්යය සඳහා ඔබට සතියක කාලයක් ලැබේ.*
- පරිගණක සහ පර්යන්ත උපාංග මිල දී ගැනීම සඳහා පිරිවිතර සැකසීම පාඩමේ පිටු අංක 1 සිට 4 අධ්‍යනය කරමින් පහත ක්‍රියාකාරකමෙහි නිරත වන්න.
- *ඔබේ පිළිතුරු හෝ නිර්මාණ **<u>පළමුවන සතිය-ICT- ඔබේ නම හා ශ්‍රේණිය</u>** ලියන ලද අමුණන ලද ගොනුවක් සේ සකස්කරන්න.*

1.1 පරිශීලක හඳුනා ගැනීම.

1) පහත වගන්ති වල හිස්තැන් පුරවන්න.

a. ක්‍රමලේඛක විසින් ..... කරයි.
b. වෙබ් අඩවි සැලසුම් කිරීම හා සංවර්ධනය කිරීම සිදු කරන්නේ ..... ය.
c. මෘදුකාංග නිර්මාණය කිරීම සිදු කරන්නේ ..... විසින් ය.
d. යතුරුලියනය සහ නිර්මාණ සංස්කරණය සිදු කරන්නේ ..... විසින් ය.
e. තොරතුරු පද්ධති සැලසුම් කිරීම ..... සිදු කරයි.
f. පරිගණක ජාල පරිපාලනය හා නඩත්තුව ..... සිදු කරයි.

1.2 පරිශීලක අවශ්‍යතාව අනුව සුදුසු පරිගණකයක් තෝරා ගැනීම.

2) ඔබ පරිගණකයක් මිල දී ගැනීමේ දී සැලකිලිමත් වන පරිශීලක අවශ්‍යතා මොනවා ද?

3) පහත දක්වා ඇති පරිගණක වර්ග වර්ගීකරණය කර එහි ඇති පරිගණක දෙකක් පිළිබඳ කෙටි සටහනක් ලියන්න.

සේවාදායක පරිගණකය	වැඩහල් පරිගණකය	නෝට්බුක් පරිගණකය
මේස පරිගණකය	ටැබ්ලට් පරිගණකය	සුහුරු දුරකථනය
උකුළු පරිගණකය	සියල්ල ම එකක පරිගණකය	

නිශ්චිත ස්ථානයක තබා භාවිතා කරන පරිගණක	ජංගමව භාවිතා කරන පරිගණක
1.	1.
2.	2.
3.	3.
4.	4.